# බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
# අන්තර් කලායතන තරගාවලිය 2023
## කලායතන තරග සඳහා අයදුම් කිරීමේ සුදුසුකම් හා පොදු කොන්දේසි

01. ඉදිරිපත් වන සෑම තරඟකරුවෙක්ම තරගකාරියක්ම බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. තරගයට ඉදිරිපත්වීමට පෙර තරගකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය සමඟ ග්‍රාම නිලධාරී විසින් සහතික කළ මෑතකදී ලබාගත් ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතුය.

02. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතනයක් විය යුතු ය.

03. තරග අයදුම් පත්‍රය කලායතනාධිපති විසින්ම අත්සන් කර නිල මුද්‍රාව තබා බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරීගේ නිරීක්ෂණ හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව පහත සඳහන් ලිපිනයට, අයදුම්පත් කැඳවා ඇති අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නැත්නම් සංස්කෘතික නිලධාරී මඟින් අමාත්‍යාංශය වෙත යොමු කළ හැකිය.

04. නර්තන සහ සංගීත තරග සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.

05. එක් එක් තරග ශීර්ෂ සඳහා සහභාගී වන සිසුන්ගේ වයස එකී ශීර්ෂය යටතේ සඳහන් කර ඇත. සහය වාදන හා ගායන කටයුතු සඳහා සහභාගී වන කණ්ඩායම සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බල නොපායි.

06. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමෙන් පසුව තරග ශීර්ෂ වෙනස් කරන්නේ නම් , තරග පැවැත්වීමට සති 02 කට පෙර එසේ සිදුකළ හැකි අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය අවශ්‍ය වේ. තරගය පැවැත්වෙන දිනය තුළ අයදුම් කළ තරග හැර වෙනත් තරග වලට ඉදිරිපත්වීමට අවස්ථාව දෙනු නොලැබේ.

07. කිසියම් සිසුවෙකු කලායතන කිහිපයක ඉගෙනුම ලැබුවත් තරග සඳහා ඉදිරිපත් විය හැක්කේ එක් කලායතනයකින් පමණි.

08. සමූහ තරග සඳහා අතිරේක ශිල්පීන් සිව් දෙනෙකු නම් කළ හැකිය. එම ශිල්පීන්ගේ නම් තරගය සඳහා ඉදිරිපත් නොවුවද, තරගයට සහභාගී වූ තරගකරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කළ යුතුය.

09. කිසියම් තරග අංගයක් සඳහා පළමු හෝ දෙවන හෝ තෙවන ස්ථාන ලබාදීමට තරම් සුදුසු තත්ත්වයක නොමැති නම් ඒ බව නිර්දේශ කිරීමට විනිශ්චය මණ්ඩලයට බලය පැවරෙනු ඇත.

10. තරග පැවැත්වෙන දිනය හා වේලාව දැනුම් දෙනු ලැබේ. ඉල්ලුම් කළ තරගයට ඉදිරිපත් වීමට විනාඩි 15 කට පෙර අදාළ විනිශ්චය මණ්ඩලයෙහි සම්බන්ධීකරණ නිලධාරීන් මඟින් සිසුන්ගේ අනන්‍යතාවයන් තහවුරු කර ගත යුතුයි.
තරග සඳහා ඉදිරිපත් වීමට ලබා දෙන වේලාවට ඉදිරිපත් නොවී ප්‍රමාදවී පැමිණෙන තරගකරුවන්ට තරගය සඳහා ඉදිරිපත්වීමට නැවත අවස්ථාවක් ලබාදෙනු නොලැබේ.

11. විරෝධතාවයක් ඇත්නම් අදාළ තරග ශීර්ෂයේ සියලු ඉදිරිපත්කිරීම් අවසන්ව විනාඩි 20 ක කාලයක් තුළ ලිඛිතව ඉදිරිපත් කළ හැකි අතර, පසුව ලබාදෙන විරෝධතා ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරගය පැවැත්වෙන අවස්ථාවේදී තරග පටිගත නොකළ යුතුය.

12. විනිශ්චය මණ්ඩල පත්කරනු ලබන්නේ අමාත්‍යාංශ ලේකම් විසිනි. විනිශ්චය මණ්ඩල මඟින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ. ප්‍රශස්ත තරග අංගයක් ඉදිරිපත් කිරීමේදී එහි කාල කළමනාකරණයෙහි සුළු වෙනසක් වුවද, එය සලකා බැලීමේ අයිතිය විනිශ්චය මණ්ඩලය සතුය. නියමිත කාලය ඉක්මවා යන්නේ නම්, එය තරග නීති උල්ලංඝනය කිරීමක් ලෙස සලකා තරගයෙන් ඉවත් කිරීමේ අයිතියද විනිශ්චය මණ්ඩලය සතුය.

13. තරග සඳහා සහභාගීවී කිසිඳු ජයග්‍රහණයක් හිමි කර නොගන්නා කලායතන සඳහා සහභාගිත්ව දීමනාවක් ලබා දෙන අතර එම දීමනාව සඳහා හිමිකම් ලැබීමට තරග සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 25ක් සහභාගී කර තිබිය යුතුය.

14. තරග පැවැත්වෙන දින එම පරිශ්‍රයේ පූර්ව පුහුණු කටයුතු සිදු කරන බව අමාත්‍යාංශය වෙත නිරීක්ෂණය වී ඇති අතර, එය තරග සංවිධාන කටයුතුවලට බාධාවක් වන බැවින් එදින එම පරිශ්‍රයේ පුහුණු කටයුතු සිදු කිරීම සපුරා තහනම් වේ. එසේ නොවීමට කලායතනාධිපතිවරුන් විසින් තම පූර්ණ අවධානය යොමු කළ යුතුය.

15. තරගාවලිය පුරා කලායතනාධිපති ඇතුළුව සියළුම තරගකරුවන් ඉහළ විනයක් හා සංයමයකින් යුක්තව හැසිරීම අනිවාර්ය වේ. එකී කොන්දේසි කඩ කරන්නේනම් තරගවලට සහභාගී වීමට ඉඩ නොදීම, සහභාගී වූ තරග වලින් ඉවත් කිරීම, ඉදිරි කලා උළෙල සඳහා අයදුම් කිරීමට ඉඩ නොදීම යන දඬුවම් වලින් එකක් හෝ කිහිපයකට යටත් කිරීමට සිදුවේ.

16. අයඳුම්පත් භාර ගන්නා අවසාන දිනය 2023 මාර්තු මස 31 දින වේ.

17. තරගකරුවන්ගේ වයස් සීමාව 2022 දෙසැම්බර් 31 දිනට ගණනය කරනු ලැබේ.

- අවුරුදු 15 -21අතර 2007.12.31 දින සිට 2001.12.31දින දක්වා උපන්
- අවුරුදු 15 -18 අතර 2007.12.31 දින සිට 2004.12.31 දින දක්වා උපන්
- අවුරුදු 12 - 21 අතර 2010.12.31 දින සිට 2001.12.31 දින දක්වා උපන්
- අවුරුදු 12 න් පහළ 2010. 12.31 දිනට පසු

18. දිස්ත්‍රික් තරග 2023 ජුනි සහ ජූලි යන මාසයන්හිදී පැවැත්වීමට යෝජිතය.

19. වැඩි විස්තර දැනගැනීම සඳහා බස්නාහිර පළාතේ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ දුරකතන අංක 011 – 2093105 හෝ 071-4450728 ලක්ෂ්මී කරුණාරත්න මහත්මිය (සංස්කෘතික නිලධාරී) මඟින් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරී/ සංවර්ධන නිලධාරී මඟින් දැනගත හැකිය.

20. මෙම චක්‍රලේඛය හා අදාළ අයදුම් පත්‍රය මෙම අමාත්‍යාංශයේ www.moe.wp.gov.lk දරන වෙබ් අඩවිය මඟින් ලබාගත හැකිය.

21. අයදුම්පත්‍ර යොමු කිරීමේදී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "බස්නාහිර පළාත් කලායතන තරග 2023 " යන්න සඳහන් කළ යුතුය.

22. අයදුම්පත්‍ර යොමු කළ යුතු ලිපිනය :

**ලේකම්**
**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)**
**2වන මහල,**
**නො.204,**
**නව පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල.**